**ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2021/ 2022**

-----------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය වියාචනය

ශ්‍රී ලංකා යූත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවෙහි 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මෙම වාර්තාවේ 1.5 කොටසේ

විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතියට පටහැනිව සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම් වටිනාකම වූ රු.1,263,640ක් සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගිණුමට බැර කිරීම වෙනුවට වියදම් ගිණුමට බැර කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | 2022/2023 මූල්‍ය වර්ෂයේ දී පාරිතෝෂික වෙන් කිරීම් සේවක ප්‍රතිලාභ වෙන් කිරීමේ ගිණුමට ගිණුම්ගත කිරීම සිදු කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 - මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීමේ ප්‍රමිතය අනුව වගකීම් සඳහා ඇපයට තබා ඇති වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, සමාගම විසින් රු.1,595,964ක වටිනාකමින් යුතු ස්ථාවර තැන්පතු විදේශ සේවා නියුක්ති කාර්යංශයේ විදේශ රැකියා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඇපයට තබා තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ දී ඇපයට තබා ඇති වත්කම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම සිදු කෙරේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.2 නොසැසඳුණු පාලන ගිණුම්

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවට ගෙවිය යුතු | 1,341,156 | 0.00 | 1,341,156 | අදහස් දැක්වීම කර නොතිබුණි. | නොසැසඳුණු ශේෂ සැසඳීමක් කර නිවැරදි කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වත්කම් | 219,486,188 | ස්ථාවර වත්කම් ලේඛණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තා, තොග ගණනය කිරීමේ වාර්තා සහ උප ලේඛණ | අදහස් දැක්වීම් කර නොතිබුණි. | විගණනය සිදුකිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වගකීම් | 113,990,290 | උප ලේඛණ, ශේෂ සනාථ කිරීම් සහ වෙනත් ලිඛිත සාක්ෂි | | |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 02 - 07 අතර කාලයක සිට අයවිය යුතුව පවතින රු.31,808,829ක් වූ අභ්‍යන්තර ලැබිය යුතු යුතු දෑ, සේවක ණය වෙනත් වත්කම්, නිවාස කුලි හා රක්ෂණ වාරික අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ සම්බන්ධව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් සාධක නොමැති බැවින් දිගින් දිගටම මෙම ශේෂයන් මූල්‍ය ප්‍රකාශන තුළ පවත්වාගෙන ඒමට සිදු වේ. | අයවිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 07කට අධික කාලයක් තිස්සේ පවතින රු.28,593,062 ක්වූ වෙනත් ගෙවිය යුතු ශේෂ සහ රු.5,486,564 ක හඳුනා නොගත් තැන්පතු ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ සම්බන්ධව අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් සාධක නොමැති බැවින් දිගින් දිගටම මෙම ශේෂයන් මූල්‍ය ප්‍රකාශන තුළ පවත්වාගෙන ඒමට සිදු වේ. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.7 ඡේදය | ස්ථාවර වත්කම් හා තොග සම්බන්ධයෙන් වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කළ යුතු වුවද, එසේ සිදුකර භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේ දී අදාළ වාර්තා ලබා දීමට කටයුතු සිදු කෙරේ. | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 15.52ක ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.මිලියන 3.89ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 19.41ක වර්ධනයක් වී තිබුණි. මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණේ ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආරක්ෂක සේවා ආදායම ඉහළ යාමය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමග සසඳා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල අගයන් එකී ප්‍රතිශතයන් සමග පහත දක්වා ඇත.

| විස්තරය | 2022 මාර්තු 31 දිනට වටිනාකම රු.මි | 2021 මාර්තු 31 දිනට වටිනාකම රු.මි | වෙනස [වාසිදායක/ (අවාසිදායක)] රු.මි | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| **ආදායම්** | | | | |
| ආරක්ෂක සේවා | 102.38 | 81.10 | 21.28 | 26 |
| පවිත්‍රතා සේවා | 22.36 | 30.72 | (8.36) | 27 |
| ආපනශාලා ආදායම් | 35.03 | 24.61 | 10.43 | 42 |
| මුද්‍රණාල ආදායම් | 7.07 | 6.06 | 1.01 | 16 |
| පාඨමාලා ආදායම් | 18.10 | - | 18.10 | 100 |
| වෙනත් | 13.37 | - | 13.37 | 100 |
| **වියදම්** | | | | |
| ආරක්ෂක සේවා | 86.01 | 80.54 | (5.47) | 6.8 |
| පවිත්‍රතා සේවා | 17.76 | 22.25 | 4.50 | 20.2 |
| ආපනශාලා වියදම් | 40.35 | 33.94 | (6.41) | 18.9 |
| මුද්‍රණාල වියදම් | 9.43 | 10.46 | 1.03 | 9.9 |
| පාඨමාලා වියදම් | 10.75 | - | (10.75) | 100 |
| වෙනත් | 18.60 | - | (18.60) | 100 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය තුලදී සමාගම විසින් හඳුන්වා දී තිබූ විකල්ප ආදායම් මාර්ග වන විදේශ අංශ පාඨමාලා පැවැත්වීම, පරිගණක පාසල පැවැත්වීම හා ඉදිකිරීම් කටයුතු මගින් ආදායම් ඉහළ නංවා ගැනීම කර තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය වෙත ලබා දී ඇති තොරතුරු හා මූල්‍ය ප්‍රකාශන අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සමාගමේ ලාභ අනුපාත සියල්ල ධන අගයක් ගෙන තිබූ අතර පෙර වර්ෂය සමග සසඳා එම අනුපාත පහත දැක්වේ.

| ලාභ අනුපාත | 2021 / 2022 වර්ෂය (ප්‍රතිශතය) | 2020 / 2021 වර්ෂය (ප්‍රතිශතය) |
|---|---|---|
| මෙහෙයුම් ලාභ අනුපාතය | 7.82 | (2.73) |
| ශුද්ධ ලාභ අනුපාතය | 6.86 | (2.76) |
| වත්කම් ප්‍රතිලාභ අනුපාතය | 6.79 | (2.05) |
| ප්‍රාග්ධන ප්‍රතිලාභ අනුපාතය | 16.26 | (4.76) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාගමේ මුළු වත්කම් වටිනාකම රු.මිලියන 228ක්වූ අතර, එම වත්කම්වලින් උපයන ලද ලාභය රු.මිලියන 15ක් පමණක් වී තිබීමෙන් වත්කම් ප්‍රතිලාභ අනුපාතය පවතින වෙළඳපොළ පොළී වටිනාකමට සාපේක්ෂව ඉතා පහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත දිනයේදී නොගෙවීම මත සමාලෝචිත වර්ෂයේ රු.5,422,676ක් අධිභාර ගෙවිය යුතුව පැවතුණි. | සමාගමේ මූල්‍ය කළමනාකාරීත්වයේ පැවති දුර්වලතාවය මත සේවක අර්ථසාධක අරමුදල් නියමිත දිනට නොගෙවීම හේතුවෙන් මෙලෙස අධිභාර ගෙවීමට සිදු වී ඇත. | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු මුදල් කාලීනව ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පෙර වර්ෂයේදී උපකරණ මිලදීගැනීම සඳහා ලබාදුන් රු.3,741,584ක අත්තිකාරම් මුදල වෙනුවෙන් භාණ්ඩ සපයා නොතිබුණද, මේ දක්වා එම මුදල අයකරගෙන නොතිබුණි. | මෙය සමාගම සහ ජාතික තරුණ සේවා සභාව සමඟ එක්ව සිදු කරන ලද ව්‍යාපෘතියකි. මේ සම්බන්ධයෙන් ජාතික තරුණ සේවා සභාව මඟින් දැනටමත් විමර්ශනයක් ආරම්භ කර ඇත. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ ආපනශාලාව, මුද්‍රණ අංශය දිගින් දිගටම පාඩු සහිතව පවත්වාගෙන යන අතර මෙම අංශ සමාලෝචිත වර්ෂයේ දී පිළිවෙලින් රු.4,576,205 ක හා රු.2,355,350 ක පාඩුවක් සිදු වී තිබූ අතර පෙර වර්ෂයේ දී පිළිවෙලින් රු.2,050,140 ක හා රු.3,079,467 ක පාඩුවක් සිදු වී තිබුණි. මෙම තත්ත්වය ලාභදායි තත්ත්වයට පත් කිරීමට ඉහළ කළමණාකරනයේ අවධානය යොමු වී නොතිබූ අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම තත්වය අවම කර ගැනීම සඳහා වර්තමාන කළමනාකරීත්වය මේ වන විටත් යම්කිසි වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී. | සමාගමේ ආදායම් ඉහළ නංවා ගැනීමට ඉහළ කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

### 3.3 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි 2022 මාර්තු 31 දිනට රු.3,912,788ක් අතැති මුදල් ශේෂය දක්වා තිබුණද, විගණන දිනය වන 2025 සැප්තැම්බර් 17 දින වන විට මෙම ශේෂයේ යාවත්කාලීන කළ මුදල් ප්‍රමාණය භෞතිකව නොපවතින බව තහවුරු විය. තවද, මෙම මුදල් ශේෂය 2023, 2024 හා 2025 මාර්තු | මෙම ශේෂයට අදාළව භෞතිකව මුදල් ප්‍රමාණය නොතිබෙන අතර, මෙම මුදල් භාවිතා කර ආයතනයේ මිල දී ගැනීම් හා අත්‍යාවශ්‍ය කටයුතු එවකට දී සිදු කර ඇත. මේ සම්බන්ධව ලිපි ලේඛන කිහිපයක් ලැබී ඇති අතර, එම ලේඛන මඟින් තහවුරු කිරීමක් සඳහා | අවිධිමත් ගනුදෙනු වලින් සිදුවී ඇති හානි තක්සේරු කර එය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 31 දිනට පිළිවෙළින් රු.2,778,140, රු. 2,778,140 හා 2,778,140 ලෙස දක්වා තිබුණද, එම ශේෂද භෞතිකව නොපවතින බව විගණනයේදී තහවුරු විය. මේ සම්බන්ධයෙන් නෛතික හා විනයානුකූල කටයුතු කරන ලෙස ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා / ගණන්දීමේ නිළධාරියා ට දන්වා යවා තිබුණද, එපරිදි කටයුතු කරද නොතිබුණි. | අභ්‍යන්තර පරීක්ෂණයක් අභ්‍යන්තර විගණන අංශය මේ වන විටත් සිදු කරමින් පවතී. | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයකු පත්කර ගැනීම සඳහා 2013 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණු අතර සහකාර ගණකාධිකාරී තනතුරද 2019 ජුනි 03 දින සිට පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය. සමාගම සඳහා ස්ථිර පදනමින් ගණකාධිකාරීවරයකු බඳවා ගැනීම සඳහා කටයුතු නොකිරීම, අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට කාලීනව ඉදිරිපත් නොවීමටද හේතු වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය. | ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම් සිදු කිරීම පිළිබඳව පුවත්පත් දැන්වීමක් පලකල අතර, ඒ අනුව අදාළ තනතුරු සඳහා 2026.01.01 නව නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කෙරේ. | ස්ථිර පදනමකින් කඩිනමින් ගණකාධිකාරීවරයෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි ඡේදය 3.1 ප්‍රකාරව කාර්යමණ්ඩලය (cadre) සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මේ දක්වා කාලය තුළ කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් බඳවා ගැනීම් සිදු කර ඇත. | කාර්යමණ්ඩලය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන ඒ අනුව බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව රාජ්‍ය සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2021/2022 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2025 ඔක්තෝබර් 22 දින එනම්, අවුරුදු 03 මාස 04ක ප්‍රමාදයකින් ඉදිරිපත් කර තිබුණි. | සමාගමේ ඉහළ කළමනාකාරීත්වයේ දේශපාලනික වෙනස්වීම් මත ද කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් මත ද මෙලෙස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ප්‍රමාද වී ඇත. | ප්‍රමාදයකින් තොරව අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත හා මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 4.4 ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. | අභ්‍යන්තර විගණකවරයෙක් පත්කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**4.3** පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 පෙබරවාරි 18 හා 20 දිනවලදී සහ 2025 මාර්තු 19 දින පැවති පිළිවෙළින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) හා එම කාරක සභාවේ අනු කමිටු සාකච්ඡා සටහන් අනුව සමාගම විසින් ඉටුකළ යුතු පහත සඳහන් කමිටු නිර්දේශ මෙම වාර්තාවේ දිනය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (i) | සමාගමේ ඉදිරි පැවැත්ම පිළිබඳ පසු විපරම් සිදුකර එහි පැවැත්මෙහි අවශ්‍යතාවය හා එය ශ්‍රී ලංකා යුත් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම යටතේ ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පිළිබඳව හා සමාගමේ ව්‍යවස්ථාවලියේ සඳහන් අරමුණු ඉටුවන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | මේ වන විට ව්‍යවස්ථාවලියට අනුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නව ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර, දැනට පවතින ව්‍යාපෘතීන් ලාභදායී තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු ද ක්‍රියාත්මක කරමින් පවතී. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සමාගම පිහිටවූ 1981 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම. | මෙතෙක් සමාගමේ වාර්ෂික වාර්තා සකස් කර නොමැති හෙයින් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩලයට යටත්ව කටයුතු සිදු කිරීමට කටයුතු කෙරේ. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (iii) | රජයේ ප්‍රතිපත්ති පිළිබඳව සැළකිලිමත් වෙමින් යාවත්කාලීන උපායමාර්ග සැලැස්මක් සකස් කර මාස 03 ක් ඇතුළත අනු කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. | නව කළමනාකාරීත්වය යටතේ නව රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | යාවත්කාලීන උපායමාර්ගික සැලැස්මක් සකස් කර අනුකාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. |